2026-05-04 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමෙදී ඵළඹුණු තීරණ

01. **කැලණිය විශ්වවිද්‍යාලයේ ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

කැලණිය විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණයට අදාළ මූලික යටිතල පහසුකම් සහ මූලික තොරතුරු පද්ධති සංවර්ධනය සඳහා මේ වන විටත් පියවර ගෙන ඇති නමුත්, ඩිජිටල් කේන්ද්‍රීය හා ගතික පරිසරයක් බවට වේගයෙන් පරිවර්තනය වන ලෝකය තුළ උසස් අධ්‍යාපන අංශයේ වත්මන් අවශ්‍යතාවන් සපුරාලීමට එය ප්‍රමාණවත් නොවන බව හඳුනාගෙන තිබේ. එබැවින්, දැනට උපාධි අපේක්ෂකයින් 16,368ක්, පශ්චාත් උපාධි අපේක්ෂකයින් 1,114ක් සහ ලියාපදිංචි වී ඇති බාහිර උපාධි අපේක්ෂකයින් 56,619ක් මෙන්ම අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය 1,700ක් පමණ වන කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම ප්‍රධාන ඉගෙනුම් හා කළමනාකරණ ක්‍රියාවලීන් වසර 02ක් ඇතුළත ඩිජිටල්කරණය කිරීම සඳහා සහ ඊට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබ තිබේ. එකී ව්‍යාපෘතිය යටතේ විශ්වවිද්‍යාලයේ පද්ධති සහ මෙහෙයුම් නවීකරණය කිරීමෙන් සේවා සැපයීම වැඩිදියුණු කිරීම, ප්‍රුළුල් පරාසයක සිසුන් ආකර්ශනය කර ගැනීම සහ මූල්‍ය තිරසර භාවය සුරක්ෂිත කර ගැනීම ආදී ප්‍රතිලාභ අත්කර ගැනීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, රාජ්‍ය ආයෝජන වැඩසටහන යටතේ හඳුනාගනු ලැබ ඇති කැලණිය විශ්වවිද්‍යාලයේ ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘතිය 2026-2027 වර්ෂයන් තුළ රුපියල් මිලියන 476ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **ශ්‍රී ලංකා ජාතික අපනයන සංවර්ධන සැලැස්ම - 2026-2030**

අපනයන තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සහ අපනයනය මූලික කර ගත් තිරසර ආර්ථික වර්ධනයක් සඳහා ජාතික ප්‍රමුඛතාවක් ලෙස ජාතික අපනයන සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා 2025 අගවැය මඟින් යෝජනා කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයන ක්ෂේත්‍රයට සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සමඟ එක්ව, ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපත්ති පාදක ණය වැඩසටහන යටතේ තාක්ෂණික සහාය ලබා ගනිමින් ජාතික අපනයන සංවර්ධන සැලැස්ම 2026-2030 සකස් කරනු ලැබ ඇත. 2030 වර්ෂය වන විට වෙළෙඳ භාණ්ඩ හා සේවා අපනයනයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 36ක විදේශ විනිමය ඉපයීම ඉලක්ක කර ගනිමින්, ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සඳහා එම සැලැස්ම මඟින් ප්‍රුළුල්

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

උපායමාර්ගික රාමුවක් සපයනු ලබයි. ඒ අනුව, 'ශ්‍රී ලංකා ජාතික අපනයන සංවර්ධන සැලැස්ම - 2026-2030' ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා වූ නිල උපායමාර්ගික රාමුව ලෙස පිළිගැනීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ප්‍රාදේශීය කර්මාන්තපුරවලින් කර්මාන්ත පිහිටුවීම සඳහා ආයෝජකයින් වෙත ඉඩම් කොටස් වෙන් කර දීම**

ප්‍රාදේශීය කර්මාන්තපුර සංවර්ධන වැඩසටහන ප්‍රාදේශීය මට්ටමින් කර්මාන්ත ප්‍රවර්ධනය අරමුණු කර ගෙන ක්‍රියාත්මක වන ප්‍රධාන වැඩසටහනකි. ඒ සඳහා ආයෝජකයින් තෝරා ගැනීම 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ විධිවිධාන පරිදි පිහිටුවා ඇති 'ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව' සහ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කර ඇති 'අමාත්‍යාංශ ව්‍යාපෘති ඇගයීම් කමිටුව' විසින් අදාළ ව්‍යාපෘති යෝජනා පූර්ණ ඇගයීමකින් අනතුරුව සිදු කරනු ලබයි. ඒ අනුව, ලැබී ඇති ව්‍යාපෘති යෝජනා 16ක් අධ්‍යයනය කර, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය කර්මාන්තපුර 09කින් ඉඩම් කොටස් වෙන් කර දීම එම කමිටු විසින් නිර්දේශ කරනු ලැබ ඇත. එකී නිර්දේශ පරිදි අදාළ ආයෝජකයින් වෙත වසර 35ක දීර්ඝකාලීන බදු පදනම් මත යෝජිත ඉඩම් කොටස් වෙන් කර දීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **ළමුන්ගේ රැකවරණ ප්‍රතිසංස්කරණ සඳහා වන ගෝලීය ප්‍රඥප්තිය පිළිගැනීම**

ශ්‍රී ලංකාව දීර්ඝ කාලයක සිට එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි පාර්ශ්වකාර රාජ්‍යයක් වන අතර, ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වන ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීමට කැප වී සිටී. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ මූලධර්ම මත පදනම්ව බහුපාර්ශ්වීය මුල පිරීමක් වශයෙන් 'ළමුන්ගේ රැකවරණ ප්‍රතිසංස්කරණ සඳහා වන ගෝලීය ප්‍රඥප්තිය' සම්පාදනය කරනු ලැබ ඇත. එම ප්‍රඥප්තිය මඟින් පවුල් වෙත සහයෝගය දැක්වීමට හා අනවශ්‍ය ලෙස දරුවන් ඔවුන්ගේ පවුල්වලින් වෙන් කිරීම වැළැක්වීමට, වෙන් වීමක් සිදු වන විට ආරක්ෂිත සහ පෝෂණය කළ හැකි පවුල්පාදක විකල්ප රැකවරණය සඳහා ප්‍රමුඛත්වය ලබා දීමට හා ළමුන් සඳහා ආයතනික රැකවරණය සැලසීම ක්‍රමයෙන් අඩු කිරීමට පියවර ගන්නා ලෙස රජයන්ගෙන් ඉල්ලා සිටිනු ලබයි. ඒ අනුව, ශ්‍රී ලංකාව විසින් ළමුන්ගේ රැකවරණ ප්‍රතිසංස්කරණ සඳහා වන ගෝලීය ප්‍රඥප්තිය පිළිගැනීම පිණිස කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **2026 වර්ෂයේ වී හා වෙනත් බෝග සඳහා අවශ්‍ය යූරියා (Prilled) මෙට්‍රික්ටොන් 20,000ක් ප්‍රසම්පාදනය කිරීම**

2026/2027 මහ කන්නය සඳහා අවශ්‍ය යූරියා පොහොර තොග සංචිත සූදානම් කිරීමට හැකි වන පරිදි සෘජු පොහොර ලෙස සහ එළවළු හා අනෙකුත් බෝග වගා සඳහා මිශ්‍ර පොහොර නිෂ්පාදනයට යූරියා මෙට්‍රික්ටොන් 20,000ක් ප්‍රසම්පාදනය කිරීමට ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ් විසින් සැලසුම් කර ඇත. ඒ අනුව, ජාත්‍යන්තර තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් යූරියා (Prilled) මෙට්‍රික්ටොන් 20,000ක් මිල දී ගැනීම පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **කැලණිවැලි දුම්රිය මාර්ගයේ ඉදිරි සංවර්ධන කටයුතු වෙනුවෙන් මරදාන සිට අවිස්සාවේල්ල දක්වා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම**

කැලණිවැලි දුම්රිය මාර්ගය මරදාන සිට අවිස්සාවේල්ල දක්වා සංවර්ධනය කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය ඉඩම් අත්කර ගැනීමට හා නැවත පදිංචි කිරීමේ කාර්යයන් සිදු කිරීමටත් මින් පෙර අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී ඇත. තවද, එකී දුම්රිය මාර්ගය දිගේ දුම්රිය ප්‍රවේශ අයිතිය තුළ ජීවත් වන පවුල් නැවත පදිංචිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමටත් අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය හිමිව තිබේ. ඒ අනුව, කැලණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමට අදාළව මරදාන සිට අවිස්සාවේල්ල දක්වා කොළඹ, තිඹිරිගස්යාය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මහරගම, හෝමාගම, පාදුක්ක හා සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි අත්‍යවශ්‍ය ඉඩම් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් අත්කර ගැනීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ (A002) කඹුරුගමුව සහ දෙව්නුවර අතර මාර්ග කොටසක් වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම**

ජාතික මහාමාර්ග සඳහා වන පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ (A002) කඹුරුගමුව සහ දෙව්නුවර අතර කිලෝමීටර 13.3ක මාර්ග කොටසක් (කිලෝමීටර 154+000 සිට කිලෝමීටර 167+300 දක්වා) පුනරුත්ථාපනය කර වැඩිදියුණු කිරීම සඳහා ජාතික තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු

04ක් ලැබී ඇති අතර, එම ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව, සාරාංශකුලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන M/s RR Construction (Pvt) Ltd වෙත එකී කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 1,207.74ක මුදලකට (එකතු කළ අගය මත බදු රහිත) පිරිනැමීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ (A002) තලල්ල සහ කුඩාවැල්ල අතර මාර්ග කොටසක් වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම**

ජාතික මහාමාර්ග සඳහා වන පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ (A002) තලල්ල සහ කුඩාවැල්ල අතර කිලෝමීටර 12.33ක් පමණ වන මාර්ග කොටසක් (කිලෝමීටර 172+705 සිට කිලෝමීටර 185+040 දක්වා) පුනරුත්ථාපනය කර වැඩිදියුණු කිරීම සඳහා ජාතික තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 07ක් ලැබී ඇති අතර, එම ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව, සාරාංශකුලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන M/s Rathna - Suhada Joint Venture Civil Engineers & Contractors (Pvt) Ltd වෙත එකී කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 818.23ක මුදලකට (එකතු කළ අගය මත බදු රහිත) පිරිනැමීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **ඕස්ට්‍රේලියාවේ සිඩ්නි ගුවන්තොටුපොළෙහිදී සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සේවයේ බිම් මෙහෙවර සේවා සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනැමීම**

ඕස්ට්‍රේලියාවේ සිඩ්නි ගුවන්තොටුපොළෙහිදී ශ්‍රීලංකන් ගුවන් සේවය සඳහා බිම් මෙහෙවර සේවා සැපයීම සඳහා පැවති කොන්ත්‍රාත්තුව 2026-04-30 වන දිනෙන් අවසන් වී ඇත. එබැවින්, එම සේවාව සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම පිණිස සීමිත ජාත්‍යන්තර තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලංසු 03ක් ලැබී ඇත. එකී ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව, සාරාංශකුලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන Menzies Aviation (Australia) Pty Ltd. වෙත ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 8.32ක මුදලකට 2026-05-01 දින සිට වසර 03ක කාලයක් සඳහා එකී කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිණිස වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **විදුලිබල පද්ධතිය සවිබල ගැන්වීමේ සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය සඳහා උපදේශක සේවා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම**

ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලබන විදුලිබල පද්ධතිය සවිබල ගැන්වීම සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය සඳහා උපදේශක සේවා ආයතනයක් තෝරා ගැනීම පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා 2025-03-17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමෙදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, අභිප්‍රාය පළ කිරීමේ යෝජනා කැඳවන ලදුව සමාගම් 11ක් විසින් සිය අභිප්‍රාය පළ කිරීමේ යෝජනා ඉදිරිපත් කරනු ලැබ ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුකූලව එකී සමාගම් අකරින් කෙටි ලැයිස්තුගත කළ ආයතන වෙත යෝජනා සඳහා ඉල්ලීමක් නිකුත් කරනු ලැබ ඇත. ඒ සඳහා සමාගම් 04ක් විසින් සිය යෝජනා ඉදිරිපත් කර තිබේ. ලැබී ඇති එම යෝජනා ඇගයීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශන ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව, එකී උපදේශන සේවා කොන්ත්‍රාත්තුව ස්පාඤ්ඤයේ Mercados Aries International S.A. වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 1.49ක + ශ්‍රී ලංකා රුපියල් මිලියන 43.20ක (එකතු කළ අගය මත බදු රහිතව) මුදලකට පිරිනැමීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **මෙගාවොට් 150 කොන්ඩව්ව් සුළං විදුලි ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම පිණිස ආසියානු සංවර්ධන බැංකුවෙන් ගනුදෙනු උපදේශන සේවාවන් ලබා ගැනීම**

පුනර්ජනනීය බලශක්ති ධාරිතාව පුළුල් කිරීමේ සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමේ රජයේ උපායමාර්ගික දැක්මෙහි කොටසක් ලෙස නව්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආකෘතියක් යටතේ සංවර්ධනය කරනු ලැබිය යුතු ප්‍රමුඛතා ව්‍යාපෘතියක් වශයෙන් කොන්ඩව්ව් සුළං විදුලි ව්‍යාපෘතිය හඳුනා ගනු ලැබ ඇත. අකිනවින බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් සමඟ සම්බන්ධ කෙරෙන මෙගාවොට් 150ක සුළං විදුලි බලාගාරයකින් සමන්විත යෝජිත ව්‍යාපෘතිය මඟින් අතථ්‍ය ස්ථාවර බලශක්ති බලාගාරයක් (Virtual Firm Energy Plant) ලෙස ක්‍රියාත්මක වීම සඳහා ද ඉඩ සැලසෙනු ඇත. තරඟකාරී ලංසු කැඳවීම හරහා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීමට සහාය ලබා දීම පිණිස ගනුදෙනු උපදේශන සේවාවන් ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් පළ කරනු ලැබ ඇති එකඟතාව යටතේ කොන්ඩව්ව් සුළං විදුලි ව්‍යාපෘතිය ව්‍යුහගත කරනු ලැබීම සඳහා එම බැංකුවේ විශේෂඥතාව උපයෝගී කර ගැනීමේ යෝග්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. එකී ගනුදෙනු උපදේශන සේවාව යටතේ ආසියානු සංවර්ධන බැංකුව ලංසු ලියකියවිලි යකස් කිරීමේ පටන් ටෙන්ඩර් කැඳවීම සහ ප්‍රදානය කිරීම දක්වා වූ ව්‍යාපෘති සංවර්ධන චක්‍රය පුරාවටම ගනුදෙනු උපදේශක වශයෙන් කටයුතු කරනු

ඇත. එමෙන්ම, එම ගනුදෙනු උපදේශන සේවාවන් සඳහා වන ඇමෙරිකානු ඩොලර් මිලියන 1.2ක ඇස්තමේන්තුගත පිරිවැය, ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය රාමුව යටතේ මූල්‍යනය කරන ප්‍රදානයක් වශයෙන් ලබා දීමට යෝජිතය. ඒ අනුව, කොන්ඩව්ටි සුළං විදුලි ව්‍යාපෘතිය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ අනුප්‍රාප්තික සමාගමක් වන නැෂනල් ඕස්ට්‍රේ ඔපරේටර් විසින් ආසියානු සංවර්ධන බැංකුවේ ගනුදෙනු උපදේශන සේවාවන් ලබා ගැනීම පිණිස බලශක්ති අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දීපව්‍යාප්තව පිහිටුවා ඇති අඩවි ආරක්ෂක කාර්යාල සහ බීට්ටු කාර්යාල සඳහා අවශ්‍ය වාහන මිල දී ගැනීම**

වන අලි කළමනාකරණ රාජකාරි කටයුතු හා අනෙකුත් ක්ෂේත්‍ර රාජකාරි අවශ්‍යතා සඳහා යොදා ගැනීම පිණිස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දීපව්‍යාප්තව පිහිටුවා ඇති අඩවි ආරක්ෂක කාර්යාල සහ බීට්ටු කාර්යාල සඳහා අවශ්‍ය වාහන මිල දී ගැනීම පිණිස 2025-08-18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ද්විත්ව කැබ් රථ 16ක්, තනි කැබ් රථ 84ක් සහ රෝද හතරේ ට්‍රැක්ටර් 09ක් මිල දී ගැනීම පිණිස ජාතික තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලැබී ඇති ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව, සාරාංශකුලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරුවන් වෙතින් පහත පරිදි එකී වාහන මිල දී ගැනීම පිණිස පරිසර අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

අනු අංකය	වාහන වර්ගය සහ සංඛ්‍යාව	ලැබී ඇති ලංසු සංඛ්‍යාව	නිර්දේශිත ලංසුකරු	මුළු වටිනාකම (බදු රහිත)
1.	ද්විත්ව කැබ් රථ - 16	04	United Motors Lanka PLC	රුපියල් මිලියන 300
2.	තනි කැබ් රථ - 84	02	Toyota Lanka (Pvt) Ltd	රුපියල් මිලියන 1,134
3.	රෝද හතරේ ට්‍රැක්ටර් - 09	04	Diesel & Motors Engineering PLC	රුපියල් මිලියන 24.75

13. **දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව සහිත තිරසර ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව සහිත තිරසර ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතය. එම ව්‍යාපෘතිය මඟින් විශ්වසනීය හා තිරසර ජල සැපයුම් හා සනීපාරක්ෂක සේවාවල ප්‍රවේශය වැඩිදියුණු කිරීම, ජල අංශයට අදාළ යටිතල පහසුකම්වල දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතට අයත් ප්‍රදේශ කිහිපයක ආදායම් නොලබන ජලය අඩු කිරීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරනු ලබයි. එම ව්‍යාපෘතිය සඳහා වන මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 250ක් වන අතර, ඉන් ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මඟින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. එම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබ තිබේ:

* අඹතලේ ජල පිරිපහදු පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
* ජුබිලි ජලසම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
* කොලොන්නාව ආදායම් නොලබන ජල කළමනාකරණ ව්‍යාපෘතිය
* ඝනමීටර 20,000ක ධාරිතාවක් සහිත ලුණුගම්වෙහෙර ඒකාබද්ධ ජල යෝජනා ක්‍රමය
* යාපනය අපජල ව්‍යාපෘතිය

ඒ අනුව, එම ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමටත්, උප ව්‍යාපෘති 05ට අදාළව ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් ආරම්භ කිරීමටත් නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතියේ II අදියර ක්‍රියාත්මක කිරීම**

රුවන්වැල්ල, බුලත්කොහුපිටිය සහ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචි 36,000ක් පමණ ජනතාවගේ ජල අවශ්‍යතා සපුරාලීම සඳහා රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය සැලසුම් කරනු ලැබ ඇත. එම ව්‍යාපෘතිය අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක වන අතර, I අදියරේ කොන්ත්‍රාත්තුව මේ වන විට පිරිනමා තිබේ. ව්‍යාපෘතියේ II අදියර යටතේ පොළව මට්ටමේ ජලාශ 03ක් ඉදිකිරීම, බූස්ටර් පොම්පාගාර 02ක් ඉදිකිරීම සහ ආශ්‍රිත විද්‍යුත්-යාන්ත්‍රික ස්ථාපනයන් ද ඇතුළුව

සම්පේෂණ නළ සහ බෙදාහැරීමේ නළ එළීම යන කොන්ත්‍රාත් පැකේජ ඇතුළත් වේ. ඒ සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම පිණිස ජාතික තරගකාරී ප්‍රසම්පාදනය ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇති අතර, ලංසු 07ක් ලැබී තිබේ. එම ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව සහ ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව, ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන M/s DIMO-CRCC-25 ඒකාබද්ධ ව්‍යාපාරය වෙත එකී කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 869.08ක (බදු රහිත) මුදලකට පිරිනැමීම පිණිස නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම**

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම පිණිස මීට පෙර අවස්ථා කිහිපයකදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. 2023-05-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලබා දී ඇති අනුමැතිය පරිදි නීති කෙටුම්පත් සම්පාදක විසින් අදාළ සංශෝධිත පනත් කෙටුම්පත මේ වන විට සකස් කරමින් පවතින අතර, ඒ සඳහා වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගැනීම යෝග්‍ය බවට නීති කෙටුම්පත් සම්පාදක විසින් දැනුම් දී තිබේ. ඒ අනුව, පාරිභෝගික කටයුතු අධිකාරිය ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාව ද සැලකිල්ලට ගනිමින්, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීමට හැකි වන පරිදි අදාළ පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුතු කඩිනමින් නිම කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. **වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩබැලීම සඳහා පත් කිරීම**

වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ සේවය කළ අමීනා ෂාහි මහත්මිය, වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2026-04-09 දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීම හේතුවෙන් මේ වන විට එකී තනතුර පුරප්පාඩු වී ඇත. ඒ අනුව, වාණිජ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම වාණිජ අධ්‍යක්ෂ ලෙස දැනට සේවය කරනු ලබන එම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වන එම්.එස්.මහදිවුල්වැව මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි ඔහුගේ නිත්‍ය තනතුරට අමතරව වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩබැලීම සඳහා පත් කිරීම පිණිස වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

17. **2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත සඳහා යෝජිත සංශෝධන**

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත බලාත්මක වීමෙන් අනතුරුව, මේ වන විට වසර 15ක් පමණ ගත වී ඇති අතර, එම කාලය තුළ දේශීය සහ ගෝලීය මූල්‍ය පසුබිම තුළ සැලකිය යුතු වෙනස්කම් සිදු වී තිබේ. එබැවින්, මුදල් සමාගම් අංශය පාලනය කරන නියාමන රාමුව සමාලෝචනය කිරීමේ සහ ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව පැන නැඟී ඇත. ඒ අනුව, විශේෂයෙන්ම බලපත්‍ර ලබා දීම, අධීක්ෂණය, නිරාකරණය, ආයතනික යහපාලනය, තැන්පත්කරුවන් රැක ගැනීම සහ අනවසර තැන්පතු භාර ගැනීමට එරෙහිව බලගැන්වීම යන කරුණුවලට අදාල පනතේ විධිවිධාන සංශෝධනය කළ යුතු බව හඳුනා ගනු ලැබ තිබේ. ඒ අනුව, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත සංශෝධනය කිරීමට හැකි වන පරිදි පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

18. **කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාරම්භක ව්‍යාපාර ලෙස නම් කිරීම**

ප්‍රයිම් මෙල්වා පෝර්ට් සිටි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ හෝම් ලැන්ඩ් පෝර්ට් සිටි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පිළිවෙලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 127.6ක් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 150.0ක් ආයෝජනය කරමින් කොළඹ වරාය නගරය තුළ අති සුඛෝපභෝගී නේවාසික කුලුනක් සහ පරිසර හිතකාමී සුඛෝපභෝගී නිවුන් නේවාසික කුලුනක් ඉදිකිරීමට සැලසුම් කර තිබේ. එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් රැකියා අවස්ථා 1,170ක් පමණ අලුතින් නිර්මාණය වනු ඇත. ඒ අනුව, ප්‍රයිම් මෙල්වා පෝර්ට් සිටි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ හෝම් ලැන්ඩ් පෝර්ට් සිටි (ප්‍රයිවට්) ලිමිටඩ්, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධාන පරිදි ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාරම්භක ව්‍යාපාරයන් ලෙස නම් කිරීමටත්, එකී ව්‍යාපාර සඳහා පනතේ යෝජිත නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

19. **ව්‍යාපාර ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයක ව්‍යාපාරයන් ලෙස නම් කිරීම**

කොළඹ වරාය නගරය තුළ තොරතුරු තාක්ෂණය, සැපයුම් සේවා, උපදේශන සේවා සහ පොදු ව්‍යාපාර හා යටිතල පහසුකම් සහ සමුද්‍රීය තාක්ෂණය යන ක්ෂේත්‍රයන් යටතේ වන ව්‍යාපාර 06ක් පවත්වාගෙන යාමට පහත සඳහන් සමාගම් විසින් සැලසුම් කර ඇත. යෝජිත ව්‍යාපාර මඟින් වසර 05ක් ඇතුළත දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 14.6ක ඍජු විදේශ ආයෝජන රට තුළට ගෙන ඒමටත්, දළ

වශයෙන් රැකියා අවස්ථා 650ක් පමණ අලුතින් උත්පාදනය කිරීමටත් අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධාන පරිදි ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතියික ව්‍යාපාරයන් ලෙස පහත සඳහන් සමාගම් නම් කිරීමටත් එකී ව්‍යාපාර සඳහා පනතේ යෝජිත නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* DIJITAL TEAM LK (PVT) LTD
* VITALHUB INNOVATIONS LAB (PVT) LTD
* WELVAART SOLUTIONS (PVT) LTD
* ADVANTIS BRIDGE (PRIVATE) LIMITED
* JAVA GLOBAL ACCESS PLATFORM FZ-LLC
* OCEAN BUILDERS LLC

20. **වියට්නාමයේ ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා රාජ්‍ය සංචාරය අකරතුර අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තැබීම**

ශ්‍රී ලංකා ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ආරාධනයක් මත වියට්නාම් සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමා 2026-05-07 සහ 08 යන දිනයන්හිදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංචාරයක නිරත වීමට නියමිතව ඇත. දෙරට අතර සහයෝගීතාව වර්ධනය කර ගනිමින් ක්ෂේත්‍ර කිහිපයක් ආවරණය වන පරිදි එකී රාජ්‍ය සංචාරය අකරතුරදී පහත සඳහන් අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තැබීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී:

* ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය හා වියට්නාම් සමාජවාදී ජනරජයේ සංස්කෘතික, ක්‍රීඩා සහ සංචාරක අමාත්‍යාංශය අතර තොරතුරු සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳව වන අවබෝධතා ගිවිසුම.

* ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ වියට්නාම් සමාජවාදී ජනරජයේ සංස්කෘතික, ක්‍රීඩා සහ සංචාරක අමාත්‍යාංශය අතර සංස්කෘතික සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම.

* ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා වියට්නාම් සමාජවාදී ජනරජයේ ජනවාර්ගික හා ආගමික කටයුතු අමාත්‍යාංශය අතර ආගමික ක්ෂේත්‍රයේ සංවර්ධනය, ආගමික ශිෂ්‍ය සුබසාධනය, ආගමික විශ්වාස, සිරිත්විරිත් ප්‍රවාරණය සහ ආරක්ෂා කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුම.

* ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සහ වියට්නාම් සමාජවාදී ජනරජයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය අතර විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන්හි සහයෝගිතාව පිළිබඳව වන අවබෝධතා ගිවිසුම.

* ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රී ලංකා ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සහ වියට්නාම් සමාජවාදී ජනරජයේ මහජන පොලිස් අභ්‍යාස ආයතනය අතර පොලිස් පුහුණුව සහ විද්‍යාත්මක පර්යේෂණ සහයෝගිතාව පිළිබඳව වන අවබෝධතා ගිවිසුම.

21. **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ රුසියානු සමූහාණ්ඩුව අතර දුම්රිය ප්‍රවාහන ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධන සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමකට එළඹීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ රුසියානු සමූහාණ්ඩුවේ ප්‍රවාහන අමාත්‍යාංශය අතර දුම්රිය ප්‍රවාහන ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධන සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමකට එළඹීමට දෙපාර්ශ්වය විසින් එකඟතාව පළ කර ඇත. මෙරට දුම්රිය ප්‍රවාහනය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව සඳහා දෙරටේ නීතිරීතිවලට එකඟව සමතාවයකින් සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ඇති වන පරිදි ඒකාබද්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම එකී අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම මඟින් අපේක්ෂා කරනු ලබයි. මෙරට දුම්රිය පද්ධතියේ යටිතල පහසුකම් ඉදිකිරීම, නවීකරණය, විද්‍යුත්කරණය, ඩීජිටල්කරණය හා උපදේශන සේවා සහ දුම්රිය උපකරණ හා අමතර කොටස් සඳහා වන සැපයුම් දාමය යන ක්ෂේත්‍රයන් සඳහා වන සහයෝගිතාව ඇති කිරීමට යෝජිත අවබෝධතා ගිවිසුම ඉවහල් වනු ඇත. ඒ අනුව, එකී අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

22. රේගු අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම

රේගු අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ දැනට සේවය කරනු ලබන එස්.පී.අරුක්ගොඩ මහතාගේ සේවා කාලය 2026-05-05 දිනෙන් අවසන් වීමට නියමිතව ඇත. ඒ අනුව පුරප්පාඩු වන රේගු අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා දැනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී විමල් එස්. කේ. ලියනගම මහතා 2026-05-06 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

****